**www.wsws.org** | **ලෝක සමාජවාදී වෙබ් අඩවිය**
හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# ඇමරිකානු ජනාධිපතිවරනයට පසු මතුව ඇති දේශපාලන ප්‍රශ්න

සසප/ලෝසවෙඅ ප්‍රසිද්ධ දේශනයක් දෙසැම්බර් 5 දා කොලඹ දී

**After the US election: the political issues**
**SEP/ WSWS public lecture in Colombo on December 5**

**2004 නොවැම්බර් 24**

ජෝර්ජ් බුෂ් එක්සත් ජනපද ජනාධිපති ලෙස යලි පත් වීම මගින් මතු කෙරෙන වැදගත් දේශපාලන ප්‍රශ්න අරබයා කොලඹ දී පැවැත්වෙන ප්‍රසිද්ධ රැස්වීමකට සහභාගි වන ලෙස *ලෝක සමාජවාදී වෙබ් අඩවිය* සහ සමාජවාදී සමානතා පක්ෂය (ශ්‍රී ලංකාව) ලෝසවෙඅ පාඨකයන්ට ආරාධනා කර සිටිමු.

මැතිවරන ප්‍රතිඵල ලොව වටා දශ ලක්ෂ සංඛ්‍යාත ජනයා කම්පනයට ලක් කොට බොහෝ ප්‍රශ්න මතු කර ඇත. ඉරාක ආක්‍රමනය යුක්තියුක්ත කිරීමට යොදා ගත් සියලු ම පච එලිදරව් වී ඇති සහ එක්සත් ජනපදය තුල ම යුද්ධයට එරෙහිව පුලුල්ව පැතුරුනු විරුද්ධත්වයක් පවත්නා තතු යටතේ බුෂ් ජය ගත්තේ කෙසේ ද? ඩිමොක්‍රැටික් පක්ෂයෙන් තරඟ වැදුනු ජෝන් කෙරී මෙම යුද-විරෝධී මනෝගතියට හෝ බුෂ්ගේ දක්ෂිනාංශික ආර්ථික හා සමාජ න්‍යාය පත්‍රය කෙරෙහි ගැඹුරින් ම පැවති විරුද්ධත්වයට කිසිදු ආයාචනයක් නො කලේ මන් ද?

බුෂ්ගේ ජයග්‍රහනයට ඉන්දියානු උප-මහාද්වීපය පුරා දේශපාලන සංස්ථාපිතය දැක්වූ නිවට ප්‍රතිචාරය මගින් තවත් ප්‍රශ්න මතු කෙරෙයි. ශ්‍රී ලංකාවේ ජනාධිපති චන්ද්‍රිකා කුමාරතුංග සහ අගමැති මහින්ද රාජපක්ෂ යන දෙදෙනා ම, ඉරාකයේ දැන් එක්සත් ජනපදය ගෙන යන ලේ වැගිරීම නොතකා හරිමින්, බුෂ් වෙත බලු ගැති සුභපැතුම් පනිවිඩ යැවී ය. ඔවුන්ගේ සභාග හවුල්කරුවෝ ද -- ජනතා විමුක්ති පෙරමුනේ (ජවිපෙ) ඊනියා මාක්ස්වාදියෝ -- එයට කිසිදු විරුද්ධත්වයක් නො දක්වා එක්සත් ජනපද අධිරාජ්‍යවාදයේ අපරාධ සම්බන්ධයෙන් එලෙස ම මුනිවත රකිති. විරුද්ධ පක්ෂ සහ ශ්‍රී ලංකාවේ මාධ්‍ය යන සියල්ලෝ ම එම පිලිවෙත ම අනුගමනය කරති.

එක්සත් ජනපදයේ සසප සහෝදර පක්ෂය සමාජවාදී විකල්පයක් සඳහා සටන් වදින එක ම පක්ෂය යි. කොලඹ දී හා මහනුවර දී පැවති ප්‍රසිද්ධ රැස්වීම් ඇමතූ සසප ජනාධිපති අපේක්ෂක බිල් වැන් ඕකන්, ලොව වටා කම්කරුවන් එක සමාන ගැටලුවලට මුහුන දෙන බවත් ඒවාට ආමන්ත්‍රනය කල හැක්කේ පොදු ජාත්‍යන්තර මූලෝපායක් මගින් පමනක් බවත් අවධාරනය කලේ ය. මිලිටරිවාදයට හා සමාජ අසමානතාවට එරෙහි කම්කරුවන්ගේ අරගල දැනුවත්ව ඒකාබද්ධ කරනු පිනිස ලෝක පක්ෂයක් අවශ්‍ය බව ද ඔහු අවධාරනය කලේ ය.

බුෂ්ගේ යලි පත් වීමත් සමග ම, එම අත්‍යවශ්‍ය නිගමනය දැවෙන හදිසි භාවයක් අත්පත් කර ගනී. එක්සත් ජනපද මැතිවරන ප්‍රතිඵලවලින් අවශ්‍ය දේශපාලන පාඩම් උකහා ගනු වස් පැවැත්වෙන කොලඹ දේශනයට සහභාගි වන ලෙස *ලෝක සමාජවාදී වෙබ් අඩවියේ* පාඨකයන්ගෙන් හා පක්ෂ ආධාරකරුවන්ගෙන් අපි ඉල්ලා සිටිමු. *ලෝක සමාජවාදී වෙබ් අඩවියේ* ජාත්‍යන්තර කර්තෘ මන්ඩලයේ සාමාජිකයකු වන සසප ප්‍රධාන ලේකම් විජේ ඩයස් දේශනය පවත්වනු ඇත.

දිනය: දෙසැම්බර් 5 වන ඉරිදා සවස 3.00

ස්ථානය: කොලඹ කොටුවේ තරුන ක්‍රිස්තියානි සංගම් (වයිඑම්සීඒ) ශාලාව.

© www.wsws.org